**කුඩා තේවතු සංවර්ධන අධිකාරිය**
**ප්‍රධාන කාර්යාලය**

**වගා සහනාධාර චක්‍රලේඛ අංක: 76**

අපේ අංකය:සං/01
2018.07.26

සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන් වෙත,

**පසෙහි සාරවත් බව තහවුරුකර ගැනීම යටතේ**
**පස පුනරුත්තාපනයෙන් තොරව තේ නැවත වගා කිරීම.**

2012.02.24 දිනැතිව නිකුත්කරන ලද වගා සහනාධාර චක්‍රලේඛ අංක: 69 ට වැඩිමනත්වයි.

තේ නිෂ්පාදනය ඉහළ නැංවීම ජාතික අවශ්‍යතාවයක් බැවින් පස සාරවත් කිරීම සඳහා ගෝතමාලා / මානා සිටුවීම වැනි තේ පර්යේෂණායතනයේ නිර්දේශ වලින් බැහැරව වසර 03 ක සැලසුමක් යටතේ තේ නැවත වගා විශේෂිත වැඩසටහනක් ක්‍රියාත්මක කලයුතු බව 2018.05.30 වන දින පැවති 552 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කරඇත.

ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් හා අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුළු නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් පැවති සාකච්ඡාවකදී මෙම කාරණය දීර්ඝ වශයෙන් සාකච්ඡාවට භාජනය වූ අතර, පස සාරවත් කිරීම සඳහා වසර එකහමාරක කාලයක් වැය කිරීමෙන් තේ වගාවෙන් ලැබෙන ආදායම අහිමිවීමේ කාලය දීර්ඝ වීම හා අඩු ආදායම්ලාභී කුඩා තේ වතු හිමියන්ට එම කාරණය දැඩිව බලපෑම, ග්ලයිෆොසෙට් භාවිතය වසර 03 කට පමණක් සීමා කිරීමෙන් ඇතිවන බලපෑම වැනි හේතු සාධක මෙම අවශ්‍යතාවයට බලපාන බව සාකච්ඡාවට භාජනය විය. ඒ අනුව තේ පර්යේෂණායතනයේ නිර්දේශ වලින් බැහැරව පසෙහි සාරවත් බව තහවුරුකර ගැනීම යටතේ තේ නැවත වගා දිරිදීමනා වැඩසටහන නිශ්චිත සැලසුමක් යටතේ ක්‍රියාත්මක කලයුතු බව තීරණය කරන ලදී.

ඒ අනුව 2012.02.24 දාතමින් නිකුත්කර ඇති වගා සහනාධාර චක්‍රලේඛ අංක:69 හි 1 (ආ) i යටතේ දැක්වෙන පස සාරවත් කිරීමෙන් තොරව තේ නැවත වගා කිරීමට අදාල නියමයන් අතරින් සහනාධාර මුදල් ප්‍රමාණය සහ (ආ) v යටතේ දැක්වෙන බිම් ප්‍රමාණය සහිත විවිවිධාන පහත පරිදි සංශෝධනයකර ක්‍රියාත්මක කිරීමට තීරණය කරඇත. මෙම කාරණයට අදාල වන අනෙකුත් විධිවිධාන නොවෙනස්ව ක්‍රියාත්මක වියයුතුය.

(ආ) **පස සාරවත් කිරීමෙන් තොරව - තේ නැවත වගා කිරීම.**

**i.** මෙම අවසරපත්‍ර සඳහා ගෙවීම් කිරීමේදී පස සාරවත් කිරීම රහිතව පහත සඳහන් පරිදි හෙක්ටයාරයකට රුපි:370,000/- ක් වන සේ ගෙවීමට කටයුතු කල යුතුය.

| වාරිකය | හෙක්ටයාරයකට රුපියල් |
|---|---|
| 1. **බිම් සැකසීම** | **130,000/-** |
| 2. **තේ වගා කිරීම** | **190,000/-** |
| 3. **නඩත්තුව** | **50,000/-** |
| **එකතුව** | **370,000/-** |

ii. පසේ සාරවත්භාවය පවතින ඉඩම් සඳහා පමණක් පස සාරවත් කිරීමෙන් තොරව වගාකිරීම සඳහා අවසරපත්‍ර නිකුත් කරන අතර,එම අවසරපත්‍ර අංකයෙහි මුලට RP/A ලෙස පරිඝණක මුද්‍රිත අක්ෂර සටහන් කල යුතුය.

iii. මේ සඳහා තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරි මගින් RP/NP – 4 මූලික පරීක්ෂණ වාර්තාව සමග මේ සමග ඇති (ඇමුණුම - 01) මාර්ගෝපදේශයට අනුව RP/NP – 4A ආකෘතිය මගින් පස පුනරුත්තාපනයෙන් තොරව තේ නැවත වගාවට යෝග්‍යතාවය පිළිබඳව නිර්දේශය ලබාදිය යුතුය.

iv. මේ යටතේ නිකුත් කරන අවසරපත්‍රවල වර්ෂයක් ඇතුළත පැල සිටුවීම සම්පූර්ණ කල යුතුවේ.

v. මෙම අනුග්‍රහය ලබාදෙනුයේ **මුළු ඉඩම් අයිතිය අක්කර 01 ක බිම් ප්‍රමාණයක් හිමි කුඩා තේවතු හිමියන්ට පමණක් වන අතර, අක්කර 01 ක් දක්වා හෝ ඊට අඩු බිම් ප්‍රමාණයක පස සාරවත් කිරීමෙන් තොරව තේ නැවත වගා කිරීම සඳහා පමණි.**

7/26

දේශබන්ධු විජේරත්න දෙවගෙදර

සභාපති

පිටපත්:

1. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (සංවර්ධන / ව්‍යාප්ති)
2. අභ්‍යන්තර විගණක
3. මුදල් කළමනාකරු
4. කළමනාකරු (මා.ස/පා)
5. කළමනාකරු (සංවර්ධන )
6. සියලුම මාණ්ඩලික නිලධාරීන්
7. සියලුම කාර්යභාර නිලධාරීන්
8. සියලුම තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන්
9. ගරු ලේකම් - සමස්ත ලංකා සංවිධානය
10. ගරු ලේකම්වරුන් - සියලුම ප්‍රාදේශීය සංවිධාන

ඇමුණුම - 01

## පස පුනරුත්ථාපනයෙන් තොරව තේ නැවත වගාවට/අළුත් වගාවට යෝග්‍යතාවය නිර්ණය කිරීම සඳහා මාර්ගෝපදේශය.

i. මෙම අනුග්‍රහය යටතේ අවසරපත්‍ර ලබාගැනීමට අපේක්ෂා කරන ඉඩමවල මූලික පරීක්ෂණ අවස්ථාවේදී තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී විසින් මූලික පරීක්ෂණ වාර්තාව සමග RP/NP-4A ආකෘතියෙන් පස සාරවත් කිරීමෙන් තොරව අවසරපත්‍ර ලබාදීම සඳහා නිර්දේශය ලබාදිය යුතුය.

ii. RP/NP-4A ආකෘතියේ දක්වා ඇති දෘෂ්‍ය නිර්නායක 6 ක් පාදක කොටගෙන එක් එක් නිර්නායකයට අදාලව ඉඩමේ පවත්නා තත්වය සළකා බලා ලකුණු ලබාදීම සිදුකල යුතුය.

iii. නිර්නායක 6 ම ඒකාබද්ධව සළකා බලන විට ලැබිය හැකි උපරිම සමස්ථ ලකුණු ප්‍රමාණය 17 කි. සලකා බලන ඉඩමේ සමස්ථ ලකුණු එකතුව ලකුණු 10 ක් හෝ ඊට වැඩියෙන් ලබාගන්නා විටදී පමණක් පස සාරවත් කිරීමෙන් තොරව තේ අළුත්වගාව/නැවත වගාව සඳහා නිර්දේශ ලබාදිය හැකිය.

iv. මෙම අනුග්‍රහය යටතේ සළකා බැලීමට සුදුසුකම් ලබන යම් කුඩා තේ වතු හිමියෙකු පස සාරවත් කිරීම සහිතවම තේ අළුත් වගාව/නැවත වගාව කිරීමට සූදානම් නම් මෙම RP/NP-4A ආකෘතිය මූලික පරීක්ෂණ අවස්ථාව සඳහා ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන අතර මූලික පරීක්ෂණ වාර්තාවේ වගාකරු පස සාරවත් කිරීම සහිතව අළුත් වගාව/නැවත වගාව කිරීමට කැමති බව සඳහන් කිරීමට කටයුතු කළයුතුය.

## පස පුනරුත්ථාපනයෙන් තොරව තේ අළුත්වගාවට/තේ නැවත වගාවට යෝග්‍යතාවය පිළිබඳ වාර්තාව

) පුනරුත්ථාපනයෙන් තොරව තේ වගා කිරීමට අපේක්ෂා කරන ඉල්ලුම්කරුවන්ගේ ඉඩම් සඳහා සැපයිය යුතු වේ.)

ලුම්කරුගේ නම :.............................................................................. අංකය

ාමේ නම :..............................................................................................

තේ අළුත් වගාවට/නැවත වගාවට* යෝජිත ඉඩමේ දැනට ඇති වෘක්ෂලතාවල වර්ධනය :

| දුර්වලයි | මධ්‍යස්ථයි | හොඳයි |
|---|---|---|
| 0 | 1 | 2 |

. යෝජිත ඉඩමේ දැනට පවතින වෘක්ෂලතා මගින් බිම් ආවරණය:

| 0 -25% | 26-50% | 51-75% | 76-100% |
|---|---|---|---|
| 0 | 1 | 2 | 3 |

3. පසේ ස්වභාවය :

| වැලි අධික | බොරළු අධික | මැටි අධික | ලෝම |
|---|---|---|---|
| 1 | 2 | 2 | 3 |

4. පසේ ගැඹුර :

| <2' | 2'-3' | 3'< |
|---|---|---|
| 1 | 2 | 3 |

5. මතුපිට පස සෝදා පාළුවීමේ තත්ත්වය:

| අධිකයි | මධ්‍යස්ථයි | සුළුයි |
|---|---|---|
| 0 | 1 | 2 |

6. මතුපිට පසේ සරු බව:

| දුර්වලයි | මධ්‍යස්ථයි | හොඳයි | ඉතා හො |
|---|---|---|---|
| 1 | 2 | 3 | 4 |

සමස්ථ ලකුණු එකතුව :

ඉහත ලකුණු පාදකව මෙම ඉඩමේ පස පුනරුත්ථාපනය සහිතව /රහිතව* හෙක්:.............................. (අක්:..........රූ....... පර්....... )ක තේ අළුත් වගා/නැවත වගා* කිරීමට නිර්දේශ කරමි.

දිනය:..................................................... ...............................................................

තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී

- නිර්නායකයන්ට අදාල ලකුණ කවයකින් සලකුණු කරන්න.
- මුළු ලකුණු එකතුව ලකුණු 10 ක් හෝ ඊට වැඩිනම් පස පුනරුත්ථාපනය රහිතව තේ අළුත් වගාව/නැවත වගාව සඳහා නිර්දේශ කළහැක.

* අදාල නොවන වචනය කපාහරින්න.